සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

24 S 1

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020
**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය ................................ තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය I කාලය පැය දෙකයි

**උපදෙස් :**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා උත්තර පත්‍රයේ (×) යොදන්න**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 යි.**

**සැළකිය යුතුයි:**

✳ මෙම ප්‍රශ්න පත්‍රයෙහි යෙදෙන තාර්කික නියත හා කර්මයන් සඳහා සංකේත භාවිත වන්නේ පහත දැක්වෙන ආකාරයට පමණි. පිළිතුරු සැපයීමේ දී ඒ අනුව සංකේත භාවිත කළ යුතුය. ප්‍රස්තුත හා ආඛ්‍යාත කලනයේ දී,
**නිෂේධනය** : $\sim$, **ගම්‍යය** : $\rightarrow$, **සංයෝජකය** : $\wedge$, **වියෝජකය** : $\vee$, **උභය ගම්‍ය** : $\leftrightarrow$
**සර්වවාචී ප්‍රමාණීකෘතය** : $\bigwedge$ , **අස්තිවාචී ප්‍රමාණීකෘතය** : $\bigvee$, **ප්‍රබල වියෝජකය** $\underline{\mathbf{V}}$

✳ **වර්ග තර්ක ශාස්ත්‍රයේ දී** A, B යන වර්ගයන්ගේ මේලය $A \cup B$, ඡේදනය $A \cap B$ හෝ $AB$, A වල අනුපූරකය $\overline{A}$ , විශ්ව වර්ගය U , ශුන්‍ය වර්ගය $\emptyset$,

✳ **බූලීය විජ ගණිතයේ දී** : ඓක්‍යය $+$ , ගුණිතය $\cdot$, X වල අනුපූරකය $\overline{X}$ , අගයන් 1 සහ 0

✳ **තර්ක ද්වාරවල දී** : AND, OR, NOT, XOR ද්වාර පිළිවලින් A හා B ආදාන සඳහා පිළිවෙලින් $A \cdot B$, $A + B$, $\overline{A}$, $A \oplus B$ ලෙසය.

1. ප්‍රබල තර්කයක් යනු,
   (1) අවයව බොහෝ සංඛ්‍යාවක් සහිත තර්කයකි.
   (2) අවයව තුලින් නිගමනය ගම්‍යවන තර්කයකි.
   (3) සත්‍ය හා අසත්‍ය අවයව ඇති සප්‍රමාණ තර්කයකි.
   (4) අසත්‍ය අවයව ඇති නිෂ්ප්‍රමාණ තර්කයකි.
   (5) හැම අවයවයක්ම සත්‍යවන සප්‍රමාණ තර්කයකි.

2. පහත සඳහන් විද්‍යා අතරින් ශුද්ධ විද්‍යාවක් වන්නේ,
   (1) ජීව විද්‍යාව (2) සායනික මනෝ විද්‍යාව (3) නාරිවේදය
   (4) වාස්තු විද්‍යාව (5) ප්‍රකාශ තන්තු විද්‍යාව

3. කතා විශ්වය නිරවශේෂ කර දක්වනුයේ,
   (1) වර්ගයක අනුපූරකය මගිනි.
   (2) වර්ග 2ක මේලය මගිනි.
   (3) වර්ග ඡේදනය මගිනි.
   (4) වර්ගයක් හා වර්ග අනුපූරකය මගිනි.
   (5) ශුන්‍ය වර්ගය මගිනි.

4. තර්ක ශාස්ත්‍රය,
(1) ඇගයුම්ශීලී විද්‍යාවකි. (2) සමාජීය විද්‍යාවකි. (3) ව්‍යවහාරික විද්‍යාවකි.
(4) න–අනුභූතික විද්‍යාවකි. (5) ශුද්ධ විද්‍යාවකි.

5. දේශීය – විදේශීය යන පද යුගල අයත් වනුයේ,
(1) ප්‍රත්‍යනික පද (2) වෛකල්‍යවාචී පද (3) සාපේක්ෂ පද
(4) විසංවාදී පද (5) සාමාන්‍ය පද

6. චර්යා විද්‍යාවකි,
(1) ගති විද්‍යාව (2) ආචාර ධර්ම (3) නීතිය
(4) මනෝ විද්‍යාව (5) කායික විද්‍යාව

7. "සමහර ළමයි දක්ෂ නැත" යන්නෙහි පරස්ථාපනය වනුයේ,
(1) ඇතැම් දක්ෂ නොවන අය ළමුන් වේ.
(2) සියළු දක්ෂ නොවන අය ළමයි වේ.
(3) කිසිම දක්ෂ නොවන්නෙක් ළමයෙක් නොවේ.
(4) සියළු ළමයි දක්ෂ නොවන්නේ ය.
(5) සමහර ළමයි දක්ෂ නොවන්නේ ය.

8. රසායනික විප්ලවයෙන් ස්ථාපනය වූ පදනම් වාදය වනුයේ,
(1) පෘථිවි කේන්ද්‍රවාදයයි. (2) ප්ලෝජිස්ටන්වාදයයි. (3) ඔක්සිකරණවාදයයි.
(4) ඕපපාතික ජනනවාදයයි. (5) සූර්ය කේන්ද්‍රවාදයයි.

9. සාමාන්‍යයෙන් ප්‍රස්තුතයක් යනු,
(1) අර්ථ සහිත වාක්‍යයකි.
(2) අර්ථ ශුන්‍ය වාක්‍යයකි.
(3) විධානමය වාක්‍යයකි.
(4) විශ්මයාර්ථ දනවන්නකි.
(5) ප්‍රකාශනාත්මක වාක්‍යයකි.

10. විද්‍යාත්මක විප්ලව අවධියෙහි යුරෝපයේ වර්ධනය වෙමින් තිබුණු ඇතැම් ශිල්පීය තාක්ෂණයන් පිළිබඳ මුල් දැනුම වෙළඳ මාර්ගයන් හරහා කුමන රටකින් යුරෝපයට සංක්‍රමණය වූ බවට පිළිගත හැකි ද?
(1) ඇමරිකා එක්සත්ජනපදය (2) ජපානය (3) චීනය
(4) රුසියාව (5) පර්සියාව

11. පහත කාණ්ඩ අතරින් ස්වභාවික විද්‍යා මෙන්ම සමාජීය විද්‍යා යන ක්ෂේත්‍රයන් දෙකටම අයත් විෂයන් ඇතුළත් කාණ්ඩය නම් කරන්න.
(1) මනෝ විද්‍යාව, කායික විද්‍යාව, පරිසර විද්‍යාව
(2) භූගෝල විද්‍යාව, මනෝ විද්‍යාව, කායික විද්‍යාව
(3) මානව විද්‍යාව, මනෝ විද්‍යාව, භූගෝල විද්‍යාව
(4) මානව විද්‍යාව, භූගෝල විද්‍යාව, හරිත විද්‍යාව
(5) මානව විද්‍යාව, පරිසර විද්‍යාව, මනෝ විද්‍යාව

12. "මල් පමණක් සුවඳවත් ය." යන්නට නිවැරදි සංකේතකරණය වන්නේ,
(1) $A \cap B = \emptyset$ (2) $\overline{A} \cap B = \emptyset$ (3) $A \cap B \neq \emptyset$
(4) $A \cap \overline{B} \neq \emptyset$ (5) $B \cap A = \emptyset$

13. සංවාක්‍ය තර්කයක දී අයතා සාධ්‍යපද ආභාසය සිදුවීමට නම්,
(1) නිගමනය විශේෂ ප්‍රස්තුතයක් විය යුතුය.
(2) නිගමනය සාමාන්‍ය ප්‍රස්තුතයක් විය යුතුය.
(3) නිගමනය නිෂේධන ප්‍රස්තුතයක් විය යුතුය.
(4) නිගමනය විශේෂ ප්‍රතිජානන ප්‍රස්තුතයක් විය යුතුය.
(5) නිගමනය සර්වවාචී නිෂේධන ප්‍රස්තුතයක් විය යුතුය.

14. ශුද්ධ විද්‍යාඥයාගේ කාර්ය මින් කුමක් ද?
(1) විද්‍යාත්මක දැනුම මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යෙදවීමයි.
(2) නිගාමී ක්‍රමයට අනුකූලව ඥානය ගොඩ නැඟීමයි.
(3) තර්කානුසාරීව කරුණු වටහා ගැනීමයි.
(4) ලොව ප්‍රපංචයන්ගේ තථ්‍ය ස්වරූපය වටහා ගැනීම.
(5) ශාස්ත්‍ර ඥානය හා ශිල්පීය ඥානය මැනවින් සංකලනය කිරීම.

15. භාරතීය තර්කශාස්ත්‍රයේ ස්වාර්ථානුමානයේ පියවර වන්නේ,
(1) හේතු, සාධ්‍ය, පක්ෂ, ව්‍යාප්ති, නිගමන
(2) ප්‍රතිඥා, හේතු, උදාහරණ, උපනය, නිගමනය
(3) ව්‍යාප්ති, සාධ්‍ය, පක්ෂ, හේතු, නිගමන
(4) ප්‍රතිඥා, උදාහරණ, උපනය, හේතු, නිගමන
(5) ප්‍රත්‍යක්ෂ, අනුමානය, අනුපලබ්ධි, කාරණ, ව්‍යාප්ති

16. කාර්ල් පොපර් මාක්ස්වාදය විද්‍යාත්මක නොවේ යැයි පවසන්නේ,
(1) ආනුභූතිමය නොවන නිසා ය.
(2) සත්‍යාක්ෂණය කළ නොහැකි නිසා ය.
(3) මනෝරාජික නිසා ය.
(4) අසත්‍ය කිරීමට යන විට සංශෝධන යොදාගෙන ආරක්ෂා කිරීම.
(5) උපකල්පන මත ගොඩනැගුණු න්‍යායක් වීම.

17.
M P
S M
∴ S P

මෙම ආකෘතිය සප්‍රමාණ වන විට අංග ප්‍රස්තුත තුන පිළිවෙළින් පැවතිය හැක්කේ,

(1) A E E (2) A O O (3) I A I
(4) E A E (5) O A O

18. විද්‍යාත්මක ක්‍රමයේ අවශ්‍ය ලක්ෂණයක් වන්නේ,
(1) උපකරණ භාවිතය (2) පුළුල් සාමාන්‍යකරණ (3) ආනුභූතික පරීක්ෂණ
(4) නව අනාවැකි ප්‍රකාශනය (5) ගණිතය භාවිතය

19. උපාශ්‍රයන ප්‍රතියෝග පැවතිය හැක්කේ,
(1) A හා O (2) A හා E (3) E හා O
(4) A හා O (5) I හා O

20. විද්‍යාවේ නියතිවාදී සංකල්පය පිළිගන්නා විධික්‍රමවාදියා මින් කවරෙක් ද?
(1) ප්‍රාන්සිස් බේකන් (2) කාර්ල් පොපර් (3) තෝමස් කුන්
(4) ජේ. එස්. මිල් (5) කාර්ල් හෙම්පල්

21. දුබල උපාශ්‍රිත සප්‍රමාණ උපප්‍රකාරයක් වන්නේ,
(1) B A B A R A (2) S E S A R E (3) D A R A P T H I
(4) B R A M A N T I P (5) S E S A R O

22. ආනුභවික විද්‍යාවක් සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) බුද්ධිය පමණක් උපයෝගී කොටගෙන දැනුම ගොඩ නැගීම.
(2) නිගාමී ක්‍රමය උපයෝගී කරගෙන දැනුම ගොඩ නැගේ.
(3) සංවිධානය වූ දැනුම පද්ධති වශයෙන් පවතී.
(4) දැනුම සංවිධානය කිරීමේ පදනම තර්කානුකූල චින්තනයයි.
(5) ගොඩනඟා ගන්නා දැනුම සම්භාවිතාවයකින් යුක්තය.

23. මධ්‍ය බහිෂ්කරන නියමයට අනුව සංකේතාත්මක වාක්‍ය වන්නේ,
(1) $(P \wedge \sim Q)$ (2) $(P \vee \sim P)$ (3) $\sim (P \wedge Q)$
(4) $\sim (P \wedge \sim P)$ (5) $\sim (P \vee \sim P)$

24. උද්ගමනවාදී විධික්‍රමය පිළිබඳව වඩාත් නිවැරදි අර්ථ දැක්වීම මින් කුමක් ද?
(1) යම් උපන්‍යාසයක් යටතට ගැනෙන විශේෂ නිරීක්ෂණ අවස්ථා කිහිපයක් සත්‍ය වීම මත එම උපන්‍යාසය සම්භාවිතාවයකින් යුතුව සත්‍ය එකක් ලෙස ගැනීම.
(2) යම් සිද්ධියක හෝ කරුණක විශේෂ අවස්ථා රාශියක් නිරීක්ෂණය කොට ඒ කරුණ හෝ සිද්ධිය පිළිබඳ උපන්‍යාසයක් ගොඩ නැගීම.
(3) අවයව සත්‍ය වන විට සත්‍යවීමට සම්භාවිතාවක් ඇති නිගමනයක් ලබා ගැනීම.
(4) සිද්ධියකට අදාළ සියලුම අවස්ථාවන් දැක ඒ මත සාමාන්‍යකරණයක් ගොඩනැගීම.
(5) යම් සිද්ධියක හෝ කරුණක විශේෂ අවස්ථාවක් නිරීක්ෂණය කොට ඒ කරුණු හෝ සිද්ධිය පිළිබඳ උපන්‍යාසයක් ගොඩ නැගීම.

25. ප්‍රමාණයෙන් අසමාන ගුණයෙන් සමාන ප්‍රස්තුත වනුයේ,
(1) A, I පමණි. (2) E, O පමණි. (3) A, O හා E, I
(4) A, I හා E, O (5) A, E හා I, O

26. විද්‍යාත්මක ඥානයේ පවතින ලක්ෂණය මින් කුමක් ද?
(1) නියත බව.
(2) සම්භාවිතාවයකින් යුක්ත බව.
(3) ආධානග්‍රාහි බව.
(4) වර්තමානයට මෙන්ම අනාගතයට ද පොදු බව.
(5) වර්තමාන තත්ත්වයන් යටතේම පරීක්ෂණ ගෝචර බව.

27. X, Y ට වඩා විශාල වේ. Y, Z ට වඩා විශාල වේ. X හා Z අතර සම්බන්ධය වනුයේ,
(1) සමමිතික සංක්‍රාමීය (2) අසමමිතික සංක්‍රාමීය (3) සමමිතික අසංක්‍රාමීය
(4) අසමමිතික අසංක්‍රාමීය (5) සංක්‍රාමීය

28. නෙප්චූන් සොයා ගැනීම නිදසුනක් ලෙස ගත හැක්කේ පහත කුමන කරුණක් සඳහා ද?
(1) සාපේක්ෂතාවාදය ආශ්‍රයෙන් කියූ අනාවැකියක් වැරදී යාමකි.
(2) ක්වොන්ටම්වාදය ආශ්‍රයෙන් කියූ අනාවැකියක් සත්‍ය වීමේ ප්‍රතිඵලයකි.
(3) නිගාමී අසත්‍යක්ෂණවාදයෙන් නව්‍ය ආනුභූතික කරුණු සොයා ගත් අවස්ථාවකට නිදසුනකි.
(4) උද්ගාමී විධික්‍රමයට නිදසුනකි.
(5) ගුරුත්වාකර්ෂණවාදය ආශ්‍රයෙන් කියූ අනාවැකියක ප්‍රතිඵලයක් වශයෙන් ගුරුත්වාකර්ෂණවාදය ප්‍රතික්ෂේප වූ අවස්ථාවකට නිදසුනකි.

29. "යමෙක් දක්ෂ නම් හේ වාසනාවන්තයෙකි." මෙහි නිරුපාධික ස්වරූපය වන්නේ,
(1) සමහර දක්ෂ අය වාසනාවන්ත ය. (2) සමහර වාසනාවන්ත අය දක්ෂ ය.
(3) සියළු වාසනාවන්ත අය දක්ෂ ය. (4) සියළු දක්ෂ අය වාසනාවන්ත ය.
(5) සමහර වාසනාවන්ත අය දක්ෂ නැත.


30. කුන්ගේ අර්ථයට අනුව ප්‍රහේළිකා විසඳන්නේ,
(1) විද්‍යාත්මක විප්ලවයක දී ය.
(2) අර්බුධ අවස්ථාවක දී ය.
(3) සාමාන්‍ය විද්‍යා අවධියේ දී ය.
(4) අසංගතතාවයන් පවතින විටයි.
(5) විද්‍යාඥයින් අතර පොදු සම්මුතියක් පවතින විටයි.

31. නිගාමී පද්ධතියක මූලිකාංගයක් නොවන්නේ මින් කුමක් ද?
(1) ප්‍රාක්තම පද (2) නිර්වචන (3) ස්වසිද්ධි
(4) අනුමිතීන් (5) අනුභූතීන්

32. සියළු ශිෂ්‍යයන් දක්ෂ නම් සමහර දක්ෂ නොවන අය ශිෂ්‍යයන් ය. මෙහි පවතින ආනයනය,
(1) අයතා පරිවර්තනයකි. (2) සප්‍රමාණ ප්‍රතිවර්තනයකි. (3) නිෂ්ප්‍රමාණ පරස්තාපනයකි.
(4) නිෂ්ප්‍රමාණ ප්‍රතිලෝමනයකි. (5) සප්‍රමාණ ප්‍රතිලෝමනයකි.

33. සාපේක්ෂකවාදී විධික්‍රමයේ පවතින ලක්ෂණය වන්නේ, මින් කුමක් ද?
(1) මුල් වාදයේ කරුණු පසුවාදයට ඌනනය කළ හැකි බව.
(2) විද්‍යාවේ අඛණ්ඩ වර්ධනයක් දැකිය හැකි බව.
(3) නිරීක්ෂණ භාෂාව ස්ථාවර බව
(4) විද්‍යාව බුද්ධිය හා ප්‍රත්‍යක්ෂය මත දැනුම ගොඩනගා ගන්නා බව
(5) අනුගාමීවාද අසංගත හා අසම්මේය වන බව

34. රූපයේ දැක්වෙන පරිදි A හා B වර්ග අයත් වන්නේ,
(1) A, B වර්ගයේ උපකුලකයකි.
(2) A හා B සමාන කුලක වේ.
(3) A හා B වියුක්ත කුලක වේ.
(4) A හා B ඡේදන කුලක වේ.
(5) A හා B ශූන්‍ය කුලක වේ.




35. අවස්ථාවෝචිත උපන්‍යාස ඉදිරිපත් නොකළ යුතුයි යන්න ලක්ටෝස්ගේ පර්යේෂණ වැඩසටහනෙහි,
(1) ධන ස්වතෝන්වේශණය යටතට ගැනේ.
(2) සෘණ ස්වතෝන්වේශණය යටතට ගැනේ.
(3) විධික්‍රමික රීතියක් ලෙස නොසැලකේ.
(4) වැඩසටහනේ වෙනස් කළ හැකි සංකල්ප
(5) පර්යේෂණ වැඩසටහන ගත යුතු මඟ දක්වන රීතියකි.

36. වර්ග තර්ක ක්‍රමයේ දී $\overline{A} \neq \emptyset$, $\overline{B} = \emptyset$ යන්නෙන් ලබාගතහැකි සප්‍රමාණ නිගමනය කුමක් ද?
(1) $\overline{B} \cap A = \emptyset$ (2) $\overline{A} \cap B = \emptyset$ (3) $A \cap B = \emptyset$
(4) $A \cap B \neq \emptyset$ (5) $\overline{A} \cap \overline{B} \neq \emptyset$

37. තෝමස්කුන්ගේ විග්‍රහයට අනුව විද්‍යාත්මක දැනුම ඉදිරියට යන්නේ,
(1) ඒක රේඛීය වර්ධනයක් තුළිනි.
(2) දැනුම කාලාන්තරයක් තිස්සේ ඒකරාශි වී වැඩි දියුණු වීමෙනි.
(3) අවිච්ඡින්නව සිදුවන වර්ධනයක් ඔස්සේ ය.
(4) විප්ලව හා ඛණ්ඩන තුළිනි.
(5) ඌහනයන් හා බහිෂ්කරණ තුළිනි.

38. "ඇයත් ඔහුත් සරසවි යන්නේ නැත." යන්නට අදාල සංකේතකරණය වනුයේ,
(1) $(\sim P \wedge \sim Q)$ (2) $\sim (P \wedge Q)$ (3) $\sim (P \vee Q)$
(4) $(\sim P \vee \sim Q)$ (5) $\sim P \vee (P \wedge Q)$

39. ලකටෝස්ට අනුව ප්‍රගතිශීලි වැඩසටහනක ලක්ෂණයකි,
(1) අවස්ථාවෝචිත උපන්‍යාස ගොඩ නැඟීම.
(2) උපන්‍යාස සංශෝධනයට ලක් කිරීම.
(3) තද මධ්‍යයට පටහැනි වන සාක්ෂි ලබාගැනීම.
(4) ඉඳ හිට හෝ නව්‍ය අනාවැකි පලකිරීම.
(5) තරඟාකාරීව වැඩසටහන් දෙකකින් එකක් තෝරා ගැනීම.

40. සුනිෂ්පන්න සූත්‍රයකි,
(1) $(A \rightarrow B)$ (2) $P \wedge Q$ (3) $\sim P \vee (P \wedge Q)$
(4) $(P \rightarrow Q)$ (5) $(\sim P \wedge \sim Q) \vee R$

41. විද්‍යාව හා එහි ක්‍රමවේදය සම්බන්ධයෙන් ආරජිකවාදී මතයකට ප්‍රවේශයක් ගන්නේ,
(1) ඩේවිඩ් හ්‍යූම් (2) කාර්ල් පොපර් (3) තෝමස් කුන්
(4) පෝල් පයරාබන්ඩ් (5) ඉම්රි ලකටෝස්

42. පහත ප්‍රකාශන අතරෙන් නිවැරදි කුමක් ද?
(1) සංස්ලේෂී අසත්‍ය ප්‍රස්තුතයක නිෂේධනය විසංවාදී ය.
(2) සංස්ලේෂී සත්‍ය ප්‍රස්තුතයක නිෂේධනය විසංවාදී ය.
(3) විශ්ලේෂී අසත්‍ය ප්‍රස්තුතයක නිෂේධනය විසංවාදී ය.
(4) විශ්ලේෂී සත්‍ය ප්‍රස්තුතයක නිෂේධනය විසංවාදී ය.
(5) සංස්ලේෂී ප්‍රස්තුතයක් පුනරුත්තියක් වේ.

43. විද්‍යාවේ විධික්‍රමයෙහි එන තෝමස් කුන්ගේ මතයෙහි සාකච්ඡා වන ප්‍රධාන සංකල්පයක් නොවන්නේ,
(1) සුසමාදර්ශි පදනම් වාද (2) අනුයාත වාද අසංගත වීම.
(3) නිරීක්ෂණයේ වාද භරිත බව. (4) අනියමයන් හා අර්බුධ අවස්ථා
(5) ඍණ ස්වතෝන්වේශණ ය.

44. උද්ගාමී අනුමානයක නිගමනය,
(1) සංගත වේ. (2) තුල්‍ය වේ. (3) සම්භාවිතාමය වේ.
(4) සත්‍ය වේ. (5) සමාන වේ.

45. ප්‍රතිඋද්ගමනය ලෙස හඳුන්වන්නේ මින් කුමක් ද?
(1) උපන්‍යාසයෙන් තාර්කිකව ගම්‍යවන අනාවැකියක් ලබාගැනීම.
(2) මුල් උපන්‍යාසයෙන් පිට පැන කරුණු සෙවීම.
(3) ප්‍රත්‍යක්ෂයට ගැලපෙන සේ උපන්‍යාස සකස් කිරීම.
(4) උපන්‍යාසයට ගැලපෙන ලෙස ප්‍රත්‍යක්ෂය සකස් කර ගැනීම.
(5) උද්ගාමී ක්‍රමයේ දී දැකිය හැකි උද්ගාමී පිහිටීම

46. අපරංග ආභාසය දක්වෙන සූත්‍රය කුමක් ද?

(1) $\dfrac{(P \rightarrow Q) \quad Q}{\therefore Q}$ (2) $\dfrac{(\sim P \rightarrow \sim Q) \quad \sim Q}{\therefore \sim P}$ (3) $\dfrac{(P \rightarrow \sim Q) \quad Q}{\therefore \sim P}$

(4) $\dfrac{(\sim P \rightarrow \sim Q) \quad \sim P}{\therefore \sim Q}$ (5) $\dfrac{(P \rightarrow \sim Q) \quad \sim Q}{\therefore \sim P}$

47. සර් අයිසෙක් නිව්ටන්ට තම පද්ධතිය ගොඩ නගා ගැනීමට උපකාරී වූ විශ්ලේෂී ජ්‍යාමිතිය හෙවත් ඛණ්ඩාංක ජ්‍යාමිතිය ලොවට හඳුන්වා දෙන ලද්දේ පහත කවරෙක් ද?
(1) ආකිමිඩිස් (2) ඇපලෝනියස් (3) රෙනී ඩේකාට්ස්
(4) පයිතගරස් (5) ඉයුක්ලීඩ්

48. ඇරිස්ටෝටලියානු තර්කශාස්ත්‍රයේ "සොක්‍රටීස් දාර්ශනිකයෙකි."යන ප්‍රස්තුතය,
(1) සර්වවාචී ප්‍රතිජානන වේ. (2) විශේෂ ප්‍රතිජානන වේ. (3) ඒකාධිවාචී නිෂේධන වේ.
(4) සර්වවාචී නිෂේධන වේ. (5) ඒකාවචී ප්‍රතිජානන වේ.

49. ලකටොස් දක්වන පර්යේෂණ වැඩසටහනක ආරක්ෂණ කලාපය සංශෝධනය කිරීම,
(1) කිසිසේක් කළ නොහැකි ය.
(2) විද්‍යාඥයාගේ අවස්ථාවාදී උපක්‍රමයකි.
(3) පරිහානියට යන වැඩසටහනක ලක්ෂණයකි.
(4) පර්යේෂණ වැඩසටහනේ තද මධ්‍ය සුරැකීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ගයකි.
(5) ඍණ ස්වතෝන්වේශණය යටතට ගැනෙන රීතියකි.

50. ඉලිප්සාකාර කක්ෂය පළමුවෙන්ම සොයා ගනු ලැබුවේ කුමන ග්‍රහයෙකු පිළිබඳව ද?
(1) බුද (2) අඟහරු (3) චන්ද්‍රයා
(4) බ්‍රහස්පති (5) සිකුරු

* * *